ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර
இலங்கை தரைப்படைத் தலைமையகம், ஸ்ரீ ஜயவர்த்தனபுர
SRI LANKA ARMY HEADQUARTERS, SRI JAYAWARDENEPURA

**මාධ්‍ය/ප්‍රචාර/08/2024 (     )**

ප්‍රධාන කර්තෘ/ ප්‍රවෘත්ති කර්තෘ අධ්‍යක්ෂ
අධ්‍යක්ෂ **(ප්‍රවෘත්ති)/ ප්‍රවෘත්ති කළමණාකරු**
**වෙබ්අඩවි කර්තෘ** 2024 අප්‍රේල් මස 08 දින

මාධ්‍ය නිවේදනය

1. යුද්ධ හමුදා මූලස්ථානය විසින් නිකුත් කරන ලද ප්‍රවෘත්ති නිවේදනය පහත සඳහන් පරිදි වේ.

**අත්සන් කළේ:**

කේ.ජී.එන් රසික කුමාර
මේජර් ජෙනරල්
අධ්‍යක්ෂ ජෙනරාල් ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම්

(මාධ්‍ය නිවේදනය)

**දීර්ඝ කාලීනව නිවාඩු නොගෙන සේවයට නොපැමිණී සිටින යුද්ධ හමුදා සාමාජිකයින් හට නීත්‍යානුකූලව යුධ හමුදා සේවයෙන් ඉවත් වීම සඳහා පොදු සමා කාලයක් ප්‍රකාශයට පත් කිරීම.**

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිවාඩු නොමැතිව සේවයට වාර්තා නොකර සිටින නිලධාරි හා සෙසුනිලයින් හට නීත්‍යානුකූලව සේවයෙන් ඉවත් වීම සඳහා 2024 අප්‍රේල් මස 20 වන දින සිට 2024 මැයි මස 20 වන දින දක්වා වූ මසක කාලය තුල පොදු සමා කාලයක් ප්‍රකාශයට පත්කර ඇත.

2024 අප්‍රේල් මස 02 දින සහ ඊට පෙර සිට නිවාඩු නොමැතිව සේවයට වාර්තා නොකරන ලද නිලධාරි හා සෙසුනිලයින් සඳහා මෙම පොදු සමා කාලය ප්‍රකාශයට පත්කර ඇති අතර, ලබාදි ඇති මෙම පොදු සමා කාලය අවසන් වන දිනය කිසිදු හේතුවක් මත දීර්ඝ කරනු නොලැබේ. ඉහත දක්වා ඇති දිනට නිවාඩු නොමැතිව සේවයට වාර්තා නොකරන ලද සියළුම නිලධාරි හා සෙසු නිලයින් පහත සඳහන් ලිපි ලේඛණ සමගින් තමන් අයිති රෙජිමේන්තු මධ්‍යස්ථාන වෙත පමණක් රපෝර්තු කල පසු නිශ්කාෂණ කටයුතු සිදුකිරීමට සූදානම් කර ඇත.

අ. යුද්ධ හමුදා හැඳුනුම්පත (යුද්ධ හමුදා හැඳුනුම්පත අස්ථානගතව ඇත්නම් මෑතකදී ලබාගන්නා ලද පොලිස් වාර්තාවක පිටපතක්).
ආ. ජාතික හැඳුනුම්පත හෝ රියදුරු බලපත්‍රයේ පිටපතක්.
ඇ. වැටුප් හා දීමනා බැරකරන ලද බැංකු පොතේ ඡායාස්ථ පිටපතක්.
ඈ. අවසන් වරට වැටුප් හා දීමනා ලබාගන්නා ලද වැටුප් පත්‍රිකාවේ ඡායාස්ථ පිටපතක් (ඇත්නම් පමනක්).

නිවාඩු නොමැතිව සේවයට වාර්තා නොකර දැනට විදේශගතව සිටින යුද්ධ හමුදා සාමාජිකයින් හටද නැවත රපෝර්තු කිරීමකින් තොරව තම රෙජිමේන්තු මධ්‍යස්ථාන සමග සම්බන්ධතාවයෙන් මෙම පොදු සමා කාලය තුලදී නීත්‍යානුකූලව සේවයෙන් ඉවත්වීම සඳහා කටයුතු සලසා දී ඇත. **(නිමාව)**